

# සත්‍යප්‍රිය මිතුරා - ලක්ෂ්මන් විජේසේකර

**'සිතුමිණක්** යයි සිතා සිටියෙමි' නැමති නිර්මලා රණතුංග ගයන මවිසින් පද රචනය කළ එතරම් ජනප්‍රියත්වයට පත් නොවුනු ගීතයේ සංගීත නිර්මාපකයා ලක්ෂ්මන් විජේසේකරය.

කිසිවක් වෙනුවෙන් හඹා නොයා උපේක්ෂාවෙන් බලා සිටීම ඔහුගේ පෞරුෂයේ වැදගත් ගුණාංගයක් විය. 1980 මැද භාගයෙන් ඇරඹෙන ඔහු සමග වන මගේ පයුරු පාසානය සරල හිත් අමාරුවක්වත් ඇති නොවන ආකාරයෙන් ගලා ගියේය. එකළ බෝඩිං කාරයෙකු වූ මට 1991 හෝ 1992 දොරට වැඩි මගේ මෙරු නවකතාවේ රාත්‍රි සාදයට සිය නිවසේ ඔහු විසින් පහසුකම් ලබා දුන් බවක් මතකය.

1994 ජනාධිපතිවරණය ඉලක්ක කොට ගෙන ආරම්භ කෙරුණු නිදහස් කලා සංධානය රට පුරා යද්දී එකම බසයක විහිළු තහළු කරමින් අපි එකට රට පුරා ඇවිද්දෙමු. ජයග්‍රහණයෙන් කෙළවර වූ සටන අවසානයේ තනතුරු බෙදා ගැනීමේ අප්‍රසන්න පොරයේ දී 'අනේ මචං' කියමින් කලකිරීමෙනුත් උපේක්ෂාවෙනුත් ඒ පොරය දෙස බලා සිටියා මට තවමත් මතකය. ලක්ෂ්මන්ගේ කලා ජීවිතය පොලා පැනීම් හා පසුකර යෑම් නොමැති එකකි. එහෙත් ලක්ෂ සංඛ්‍යාත රසික සමූහයක් ලකීගේ සෙමෙන් ගමන අනුමත කරමින් ඔහු සමග රැඳී සිටියේය. එකළ කලාභූමිය ඇරී ගෙදර යන ගමන් ඔහු, ආනන්ද වීරසිරි ආදීන් සමග එක්වන අප සමහර දිනෙක එකළ නුගේගොඩ හන්දියේ 'පුබුදු ' එකෙන් යමක් සප්පායම් වෙමින් බොහෝ රෑ වෙන තුරු බොහෝ දෑ කතා කෙළෙමු. ඔහු එකළ නම් බයිට්, සැන්ඩ් හා දුම්බීමෙන් තොරව මත්පැනෙහි සත්‍ය රසය විඳින අයුරු අපට නම් පුදුමය උපදවයි. ඇතැම් විට මේ 'සත්‍ය ප්‍රිය' මිතුරාගේ ඒ සත්‍යකාමී බව විදහා දැක්වෙන සංකේතයක් ලෙස ගිනිය හැකිය.



ලකීගේ මනුස්සකම් ගැන ලියන්නට බොහෝ දේ ඇතැත් ඒවා නොලියා සිටිමි. ඇතැම් විට ඒවා ගැන කවදාවත් ලියන්නටත් බැරි වෙනු ඇත.

ඉපදුනු රටින් බැහැර වූ කළ තමාගේ සමීප නෑදෑයිනට අමතරව සිහිපත් වන්නේ තමන්ට ප්‍රිය මනාප වූ දෙවියන් වැනි මිනිසුන් හා තමන්ට වද දුන් යක්ෂයන් වැනි මිනිසුන් පමණකි. ලක්ෂ්මන් විජේසේකර වනාහි එසේ නිතර දෙවේලේ මතක් වන දෙවියෙක් වැනි මිනිසෙකි. මිට වසර හතළිහකට පමණ පෙරාතුව ඔහුගේ මිත්‍ර වළල්ලට මා ඇතුළු කළ අනෙකුත් මිතුරන්ට හා සිදුවීම් වලට ස්තුති වේවා.

**චන්ද්‍රරත්න බණ්ඩාර**

සිතුවම- අජිත් රන්ජන් ඒකනායක


ගොඩගේ ජාතික සාහිත්‍ය සම්මාන උළෙල - 2021

සම්මාන දිනූ කෘති

සිංහල

**හොඳම නවකතාව** ඩබ්. ඒ. සිල්වා අනුස්මරණ සම්මානය
• මඩරන් සේන තෝරදෙනිය - සූරිය ප්‍රකාශන

**හොඳම කෙටිකතා සංග්‍රහය** ජී. බී. සේනානායක අනුස්මරණ සම්මානය
• නිරෝධායන චාරිකාව කපිල කුමාර කාලිංග - සූරිය ප්‍රකාශන

**හොඳම කාව්‍ය සංග්‍රහය** ආර්. මහින්ද හිමි අනුස්මරණ සම්මානය - සම්මානය
• හෝමළනී - ලාල් හෑගොඩ - විදර්ශන ප්‍රකාශන

**හොඳම යොවුන් නවකතාව** ටී. බී. ඉලංගරත්න අනුස්මරණ සම්මානය - සම සම්මාන
• අපොයියාව - මහින්ද ප්‍රසාද් මස්ඉඹුල - සන්ථව ප්‍රකාශන
• රන්බිම - බෝධි විද්‍යාරත්න - සරසවි ප්‍රකාශන

**හොඳම පරිවර්තන සාහිත්‍යය** සිරිල් සී. පෙරේරා අනුස්මරණ සම්මානය - සම්මානය
සම්මානිත කෘතියක් නම් නොකෙරෙන අතර කුසලතා සහතික හතරක් පිරිනැමීමට නිර්දේශිතය.
1. මගේ මාමා චෙං හන් ලායි - මනෝ ප්‍රනාන්දු - නෙප්චූන් ප්‍රකාශන
2. මරණයේ හැනිහලාව - පුෂ්ප රන්ජන් විජේසිංහ - සදීපා ප්‍රකාශන
3. ෆාහියන් හිමියේ අසිරිමත් වන්දනාව - ජී. ඒ. නාලිනී - සරසවි ප්‍රකාශන
4. සෝපියන්ලා - උපාලි රත්නායක - සරසවි ප්‍රකාශන

**හොඳම ශාස්ත්‍රීය කෘතිය** [illegible] අනුස්මරණ සම්මානය
• ධ්වනි සිද්ධාන්තය හා පරිභාෂික විචාරය - ආනන්ද අබේසිරිවර්ධන - ගොඩගේ ප්‍රකාශන

**හොඳම පුවත්පත් තීරුලිපි සංග්‍රහය** ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ අනුස්මරණ සම්මානය
• මීඩියා මතක කපිල එම්. ගමගේ - සදුර ප්‍රකාශන

**වසරේ නිර්මාණශීලී නවක දායකත්වය (නවකතාව)**
• ගුහා සටන කාංචනා අම්ලානි - සදුර ප්‍රකාශන

**වසරේ නිර්මාණශීලී නවක දායකත්වය (කෙටිකතා සංග්‍රහ)**
• කියවා පිළිස්සිය යුතු කතාවක් සුමුදු අතුකෝරල - සදුර ප්‍රකාශන

**වසරේ නිර්මාණශීලී නවක දායකත්වය (කාව්‍ය සංග්‍රහ)** - සම සම්මාන
• නොපෙනෙන ජීවිත රජිව දසනායක - ගොඩගේ ප්‍රකාශන
• ගජමුතු සහ කඳුළු නන්දසිරි තිඹිරියහෙට්ටිගේ - සන්ථව ප්‍රකාශන

**වසරේ නිර්මාණශීලී නවක දායකත්වය (යොවුන් නවකතා)**
• කිරි අත්තාගේ සිහිනය දිව්‍යාංජලී ඇල්වලදෙණිය - [illegible] ප්‍රකාශන

ඉංග්‍රීසි - English

*Best Novel* - හොඳම නවකතාව
*No Award for Novel*

*Best Collections of Short Stories* - හොඳම කෙටිකතා සංග්‍රහය
*No Award for Short Stories*

*Best Composition of Poetry* - හොඳම කාව්‍ය සංග්‍රහය
*Lakdasa Wickramasingha Memorial Award*
• Fly High - Kamani Jayasekara - Godage Published
• Breaking Barriers - Kandiah Shriganeshan - English Association of Jaffna


# ආදරණීය ලක්ෂ්මන්...

**1969** අග භාගයේ දිනක 'රජයේ සංගීත විද්‍යාලය'ට ඇතුලත් වීමේ පරීක්ෂණයට ආපු සියගණනක් තරුණ තරුණියන් අතරින් උඹත් මමත් එක් නිමේෂයක් තුලදී සමීපතම මිතුරන් බවට පත්ව දැඩිව අත් අල්ලා ගත්තේ මට හිතෙන විදිහට සංසාරගත බැඳීමකින් විය යුතුයි.

අපේ හිත් පතුලටම පාරවමින් 'මේ විදිහට' 'මේ තරම්' ඉක්මණින්ම මෙලොව අතහැර යන තෙක්ම උඹ මගේ එකම 'බඩ බැදගත්' මිතුරා වුනා නේද? වචනවල පරිසමාප්තාර්ථයෙන්ම අව්‍යාජ, පිවිතුරු, අවංක, විවෘත, හෘදයංගම ගමන් සගයෙකු එදා මෙදා තුර මට ලැබීම මා පූරුවේ කළ පින් මහිමයකින් සිදු වූවක්.

සංගීත ලොවේ එක්ව ආ 52 වසරක දිගු ගමන තුල අපි එකිනෙකාට හදවතින්ම ලෙන්ගතු වෙමින් ,ආශීර්වාද දෙමින් ඇප උපකාර වෙමින්, ධෛර්යය දෙමින්, දුක සැප බෙදා ගනිමින්, මෙන්ම දෙදෙනාගේම ජග්‍රණයන් එකසේ අගයමින් හා හැල හැප්පීම් වලදී එකිනෙකා රැකගනිමින් පසුකළ ඒ සුන්දර යටගියාව මෙනෙහිවෙද්දී මගේ නෙත් වලින් නිරායාසයෙන් ගලායන කඳුළු නවතාගන්නට 'සංවේදී මිතුරෙකු' ලෙස මට හැකියාවක් නෑ මචං.

උඹෙන් මම ඉගෙනගත්තු දේ බොහෝමයි. ඒවා කිසියම් ප්‍රමාණයක් හුරුකර ගන්නට මං උත්සාහ කලත්, උඹ වගේ ඒ උතුම් ගතිගුණ හැම එකක්ම එකම විදිහට ප්‍රායෝගිකව පිළිපදින්නට මට බැරිවුනා කියන්න මම ලැජ්ජා වෙන්නෙ නෑ.

ඒවා තමයි, උඹ තුල තිබුනු පරාර්ථකාමීත්වය,පරිත්‍යාගශීලී බව,



උපේක්ෂාව, කෘතවේදීත්වය, අන්‍යෝන්‍ය අවබෝධය, ඍජු බව, අල්පේච්ඡතාව, සමානාත්මතාව, දරාගැනීමේ හැකියාව, හා හෘද සාක්ෂිය සමග ජීවත් වීම වගේ උතුම් ගුණාංගයන්.

උඹ වගේ උතුම් මිතුරෙකුට මම අජරාමර නිවන් සුව අත්වේවා කියල කෙලින්ම පතන්නෙ කොහොමද?

බණ දහම් ගැඹුරට හදාරන ඇතැම් අය මෙන් බැඳීම් අත් හරින්න තරම් මම හිත දියුණු කර නැහැ. ඒ නිසා බුදුන් වහන්සේ දෙසූ පුනරුත්පත්තිය අනුව උඹ ජාති ජාතිත් මගේම මිතුරා වී ඉපදියන්. අවසානයේ යම් භවයකදී අප දෙදෙනාම එක්ව බුදුන් දැක නිවන් දකින්නට ප්‍රාර්ථනා කරමු.

**රෝහන වීරසිංහ**